## මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ විශ්වවිද්‍යාල හා ඊට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනයන්හි තනතුරේ තහවුරු කරන ලද ස්ථිර සේවකයන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් හා අදාළ ලේඛන තමා සේවය කරන ආයතනයේ ලේකම්/ ලේඛකාධිකාරී/මණ්ඩපාධිපති/අධ්‍යක්ෂ මගින් 2026.11.09 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී /ආයතන (අනධ්‍යයන) වෙත ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### තාක්ෂණික නිලධාරී (II) ශ්‍රේණිය "ආ" ඛණ්ඩය

අවශ්‍ය සුදුසුකම්

(අ) අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 05ක් සහිතව විෂයයන් 06කින් සමත් වී තිබීම. (සම්මාන සාමාර්ථ ලබාගත් විෂයයන් අතරට විද්‍යාව හා ගණිතය යන විෂයයන් ඇතුළත් විය යුතුය.)

හෝ

(ආ) තෙවරකට නොවැඩි වාර ගණනකදි අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් විද්‍යාව සහ ගණිතය විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත්ව තිබීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වර්ෂ 08ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් තිබීම.

හෝ

(ඇ) උසස් අධ්‍යාපන ආයතනයක විද්‍යාගාර සහායකයකු වශයෙන් වසර 15ක ස්ථිර සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**වැටුප් ක්‍රමය : U-MT I (III) රු. 51,095 – 7x540; 10x640 – 60,575 (මාසික) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.

බඳවා ගන්නා ක්‍රමය : යෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි

බඳවාගනු ලබන තැනැත්තන් ප්‍රථමයෙන් අවුරුදු (03) ක පුහුණුවීමේ කාලසීමාවකට යටත්ව "පුහුණුවන තාක්ෂණික නිලධාරී" වශයෙන් පත් කරනු ලැබේ. පුහුණුවීමේ කාලය අවසන් වීමෙන් පසු විද්‍යාගාර කටයුතු පිළිබඳ නිපුණත්වය, භාණ්ඩ ඇණවුම් කිරීම, තොග පොත් පවත්වාගෙන යාම සහ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරු ලිවීම පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගත් සේවක භවතුන් තනතුරෙහි තහවුරු කර II ශ්‍රේණිය "ආ" ඛණ්ඩයේ තාක්ෂණික නිලධාරී තනතුරට පත් කරනු ලැබේ.

### මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය)

අවශ්‍ය සුදුසුකම් : සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගය සමත් වීම සහ විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයෙකු විය යුතුය.

**වැටුප් ක්‍රමය : UMT I (III) - රු. 51,095-7 X 540; 10 X 640 - 60,575/- (මාසික) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.

බඳවා ගන්නා ක්‍රමය : සම්මුඛ පරීක්ෂණයක් මගින්

** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතනික චක්‍රලේඛ ලිපි අංක 06/2020 අනුව විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තනතුරකින් වෙනත් තනතුරකට පත්කිරීමේදී රජයේ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 09 වන වගන්තියට අනුව අදාල වැටුපෙහි පිහිටවනු ලැබේ.

ලේඛකාධිකාරී
මොරටුව විශ්වවිද්‍යාලය
2026.10.22